# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1934/7 - 2015 සැප්තැම්බර් මස 28 වැනි සඳුදා - 2015.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xiv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20 (4) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20 (4) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර විශ්වවිද්‍යාල අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ශ්‍රී ලංකාවේ, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු බරපතල ලෙස අවුල් වී ඇති බවට සහ එම විශ්වවිද්‍යාලයේ බලධාරීන් විසින් එම විශ්වවිද්‍යාලයේ කටයුතු යථා තත්ත්වයට ගෙන ඒමට අපොහොසත් ව ඇති බවට ද සෑහීමකට පත් වීමෙන් පසු, එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ ශ්‍රී ලංකාවේ, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද පිළිවෙලින් යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ කාර්යය සඳහා එකී උපකුලපති වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය උමා කුමාරසාමි, 2015 ඔක්තෝබර් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෙම නියමය මගින් පත් කරමි.

ලක්ෂ්මන් කිරිඇල්ල,
විශ්වවිද්‍යාල අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය.

2015 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

10 - 522

1A - PG 2616 — 507 (2015/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*